(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 1(1).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 අගෝස්තු 19 සිකුරාදා**

**2022 සැප්තැම්බර් 06 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමාජ මාධ්‍ය පාලනය කිරීම සඳහා නව නීති පැනවීමට අදහස් කර තිබේද;

(ii) එවකට අධිකරණ අමාත්‍යවරයා විසින් සිංගප්පූරු රජය සමඟ මේ පිළිබඳ සාකච්ඡාවක් පවත්වා ඇති බව පිළිගන්නේද;

(iii) සමාජ මාධ්‍ය සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

26/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කැරම් ක්‍රීඩාව දියුණු කිරීම වෙනුවෙන් 2019 වර්ෂය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) එම මුදලෙන් රජයේ පාසල් සඳහා වෙන් කරන ලද මුදල;

(iii) ඉහත (i) හි සඳහන් මුදලෙන් පාසල් හැර ගිය දරුවන්ගේ කැරම් ක්‍රීඩා කුසලතා වර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කැරම් ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීම වෙනුවෙන් පාසල් ක්‍රීඩකයන් මෙහෙයවීම සඳහා සැලසුම් සකස් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ජාතික කැරම් සංගමය හා ඊට අනුබද්ධ අනෙකුත් සංගම්වල පරිපාලන හා සංවර්ධන කටයුතු සඳහා රජය සම්බන්ධ වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සම්බන්ධ වන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

294/2022

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර ගුඩ් ෂෙඩ් බස් නැවතුම්පළ නවීකරණයට අදාළ වැඩ කටයුතු අවසන් කරනු ලබන දිනය කවරේද;

(ii) එම බස් නැවතුම්පළ නවීකරණය සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) ගුඩ් ෂෙඩ් බස් නැවතුම්පළ නවීකරණයට සමගාමීව මහනුවර දුම්රිය ස්ථානයත් නවීකරණය කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහනුවර ගිනි නිවන හමුදා ප්‍රධාන කාර්යාලය අසල උමං මාර්ගයක් ඉදි කිරීමට තීරණය කර තිබේද;

(ii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iii) එම උමං මාර්ගය ඉදිකිරීමට අදාළව පරිසර වාර්තාවක් ලබා ගෙන තිබේද;

(iv) ඒ සම්බන්ධයෙන් පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණයක් ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

340/2022

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති, රජය හෝ වෙනත් ආයතන විසින් පාලනය කරනු ලබන ළමා නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාසවල රැකවරණය ලබන ගැහැණු හා පිරිමි දරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම දරුවන් සඳහා අවශ්‍ය අධ්‍යාපනය ලබා දීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ළමා නිවාසවල දරුවන් සමාජගත වූ පසු රැකියා කරා යොමු කිරීමේ වැඩපිළිවෙළක් තිබේද;

(ii) නොඑසේ නම්, එවැනි වැඩපිළිවෙළක් සකස් කළ යුතු බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එවැනි වැඩපිළිවෙළක් සකස් කරනු ලබන කාල වකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

672/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත සේවකයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා ඉහළ නැංවීමට තීරණය කිරීම සඳහා හේතු වූ සාධක කවරේද;

(ii) විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා ඉහළ නැංවීම හේතුවෙන් වයස අවුරුදු 55 සම්පූර්ණ වීමේදී, සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ ප්‍රතිලාභ ලබා ගැනීමේ හිමිකම අහිමි වන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

965/2022

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක සමුපකාර ණය දෙන සමිති (සණස) සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කයේ කුරුමන්වෙලි සහ එරුවිල් යන ගම්මානවල පිහිටා ඇති සමුපකාර ණය දෙන සමිති විධිමත් පරිදි ක්‍රියාත්මක කරනු ලබන බව දන්නේද;

(iii) එම දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශවල පිහිටා ඇති සමුපකාර ණය දෙන සමිති විධිමත් පරිදි ක්‍රියාත්මක කරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඉහත සමිති සඳහා ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් වන සැලසුම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1104/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා කෘෂි දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම අතිශය වැදගත් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කෘෂි දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) මේ දක්වා ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iv) කෘෂි දත්ත ගබඩාව ස්ථාපිත කිරීමේදී යම් වංචාවක් සිදුවී තිබේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1512/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දෛනික ඉන්ධන අවශ්‍යතාවය එක් එක් ඉන්ධන වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා වැය කරනු ලබන මුදල ඇ. එ. ඩොලර්වලින් කොපමණද;

(iii) 2019 වර්ෂයේ ශ්‍රී ලංකාවට ගෙන්වන ලද ඉන්ධන ප්‍රමාණය එක් එක් ඉන්ධන වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒ සඳහා වැය කරන ලද මුදල එක් එක් ඉන්ධන වර්ග අනුව ඇ. එ. ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2022 වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා මාසිකව ශ්‍රී ලංකාවට ගෙන්වන ලද ඉන්ධන ප්‍රමාණය එක් එක් ඉන්ධන වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල එක් එක් ඉන්ධන වර්ග අනුව ඇ. එ. ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනතෙක් ශ්‍රී ලංකාවට ඉන්ධන ලබා ගන්නා ලද පදනම (ණය/අත්පිට මුදල්), එම ඉන්ධන ආනයනය කරන ලද එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1524/2022

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ලංකා පොස්පේට් සමාගමේ ආරක්ෂක අංශයක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම ආරක්ෂක අංශයේ අනුමත කාර්ය මණ්ඩලය කොපමණද;

(iii) එම ආරක්ෂක අංශය, සීමාසහිත ලංකා පොස්පේට් සමාගමෙන් ඉවත් කර පුද්ගලික ආරක්ෂක සමාගමකට ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ගෙන තිබේද;

(v) එම ආරක්ෂක අංශය පුද්ගලික සමාගමකට ලබා දීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1670/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය සේවයට අලුතින් බඳවාගන්නා ලද අභ්‍යාසලාභි උපාධිධාරීන්ට ප්‍රසූත නිවාඩු ලබා නොදීමට තීරණයක් ගෙන තිබේද;

(ii) එම තීරණය හේතුවෙන් ඔවුන්ට බලවත් අසාධාරණයක් සිදු වී තිබෙන බව පිළිගන්නේද;

(iii) ඉහත තීරණය ඉවත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2022 සැප්තැම්බර් 07 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1893/2022

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෙස් බද්ද නමින් බද්දක් තිබෙන බව දන්නේද;

(ii) එම බද්ද පැනවීමේ අරමුණු කවරේද;

(iii) එම බද්ද අය කරනු ලබන ක්ෂේත්‍ර කවරේද;

(iv) 2015 වර්ෂයේ සිට මේ දක්වා සෙස් බදු වශයෙන් එකතු කරන ලද මුදල කොපමණද;

(v) මේ වනවිට එම බද්ද පැනවීමේ අරමුණු ඉටු වී තිබේද;

(vi) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1998/2022

ගරු ජේ.සී. අලවතුවල මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෑතකදී ශ්‍රී ලංකාවෙන් වාර්තා වූ එක් එක් ගෘහස්ථ ගෑස් සිලින්ඩර් පුපුරා යාම හේතුවෙන් අනතුර සිදු වූ ස්ථානය, ඊට අදාළ පොලිස් බල ප්‍රදේශය, පරිපාලන දිස්ත්‍රික්කය, එම අනතුර හේතුවෙන් සිදු වූ හානිය සහ එම අනතුර හේතුවෙන් සිදු වූ මූල්‍යමය අලාභය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම අනතුරු හේතුවෙන් සිදුවූ ජීවිත හානි, තුවාල වීම් සහ දේපළ හානි වෙනුවෙන් වන්දි ගෙවීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඉහත සඳහන් එක් එක් අනතුර වෙනුවෙන් ගෙවීමට අපේක්ෂිත වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉදිරියේදී මෙවැනි අනතුරු සිදුවීම වළක්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2039/2022

ගරු ලලිත් එල්ලාවල මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා විමුක්ති පෙරමුණේ හිටපු නායක රෝහණ විජේවීර මහතාව 1989.11.12 වන දින එවකට පැවති රජය විසින් අත්අඩංගුවට ගෙන ඒ බව මාධ්‍ය මඟින් ප්‍රකාශයට පත් කරන ලද බවත්;

(ii) 1989.11.13 වන දින ඔහු මිය ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රෝහණ විජේවීර මහතාගේ මරණය ස්වභාවික මරණයක්ද;

(ii) නොඑසේ නම්, ඝාතනයක්ද;

(iii) එම මරණය ඝාතනයක් නම්, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අධිකරණයක් මඟින් ලබා දෙන ලද නඩු තීන්දුවක් තිබේද;

(iv) මෙම මරණය සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයකු හෝ නායකයකු හෝ විසින් නීති මඟින් කටයුතු කිරීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2040/2022

ගරු වේලු කුමාර් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, පහත හේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචි පවුල් අතරින් පානීය නල ජල පහසුකම් සහිත පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2058/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හොරණ, වගවත්ත ප්‍රදේශයේ ආරම්භ කරන ලද ටයර් කර්මාන්තශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබා දෙන ලද ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් ලබාදීමේදී අය කරන ලද මුදල කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය පැවති පාර්ශ්වයේ නම කවරේද;

(iv) ඉහත කර්මාන්තශාලාව ඉදිකිරීම සඳහා එම ඉඩම් පවරා දෙන ලද ගැසට් පත්‍රයේ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2168/2022

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ 2021 වර්ෂයේ යල කන්නයේ වී වගා කරන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතරින් කාබනික පොහොර භාවිතා කරමින් වී වගා කරන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) කාබනික පොහොර භාවිතා කරමින් වී වගා කරන ලද ගොවීන්ට දෙනු ලබන සහන කවරේද;

(iv) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කාබනික වී ගොවිතැන ප්‍රචලිත කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2516/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ පාසල් සිසුන්ගේ මන්දපෝෂණ අනුපාතය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පාසල් සිසුන්ගේ මන්දපෝෂණය තුරන් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2531/2022

ගරු තවරාජා කලෙයි අරසන් මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අම්පාර දිස්ත්‍රික්කයේ —

(i) නිවාස අවශ්‍යතා සහිත පවුල් සංඛ්‍යාව;

(ii) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ආධාර මත පෞද්ගලික ඉඩම්වල අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව;

(iii) ආදර්ශ ගම්මාන ලෙස ඉදිකර ඇති නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2018 සිට 2020 දක්වා වූ කාල වකවානුවේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් තිරුක්කෝවිල්, නාවිදන්වෙලි, ආලයඩිවේම්බු සහ සමන්තුරේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල යුද්ධයෙන් පීඩාවට පත්වූවන් සඳහා ක්‍රියාත්මක කරන ලද නිවාස ඉදිකිරීමේ වැඩසටහනට අදාළ හිඟ මුදල් ලබා දෙනු ලබන දිනය;

(ii) එම වැඩසටහන අවසන් කරනු ලබන දිනය;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 සැප්තැම්බර් 08 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2534/2022

ගරු මධුර විතානගේ මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ශ්‍රම වාසනා අරමුදලේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2550/2022

ගරු කුමාරසිරි රත්නායක මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මොනරාගල දිස්ත්‍රික්කයේ ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත කාලය තුළදී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මොනරාගල දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවාස ගම්මාන අතරින් මේ වනවිට වැඩ අවසන් කර ඇති නිවාස ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(iv) මේ දක්වා වැඩ අවසන් කර නොමැති නිවාස ගම්මාන තිබේ නම්, ඒවායේ නම් කවරේද;

(v) එම නිවාස ගම්මානවල වැඩ අවසන් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2019 සිට මේ දක්වා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මොනරාගල දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට වැඩ අවසන් කර ඇති හා මේ වනවිට ඉදිකරමින් පවතින නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2563/2022

ගරු සංජීව එදිරිමාන්න මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මධ්‍යම රජයේ ආයුර්වේද රෝහල් සංඛ්‍යාව සහ පළාත් ආයුර්වේද රෝහල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මධ්‍යම රජයේ ආයුර්වේද රෝහල් ස්ථාපිත කර ඇති ප්‍රදේශ කවරේද;

(iii) ආයුර්වේද රෝහල් සඳහා වෛද්‍යවරුන් බඳවාගැනීමට සැලසුම් කර තිබේද;

(iv) එසේ නම්, එම වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දේශීය ඖෂධ උද්‍යාන සංවර්ධනය කිරීම සඳහා මේ වනවිට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම උද්‍යාන සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා ස්ථාපිත කර ඇති ප්‍රදේශ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2575/2022

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල සේවය කරනු ලබන වැඩබලන විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) වැඩබලන විදුහල්පතිවරුන්ට ස්ථිර පත්වීම් ලබා දීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) ඉහත වැඩබලන විදුහල්පතිවරුන්ට ස්ථිර පත්වීම් ලබා දෙනු ලබන දිනය කවරේද;

(iv) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(v) නොඑසේ නම්, අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2582/2022

ගරු ලලිත් වර්ණ කුමාර මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති සමථ මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමථ මණ්ඩල තුළින් මේ දක්වා සමථයට පත්කර ඇති ආරවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) වර්තමානයේදී සමථ මණ්ඩල ක්‍රමය අමාත්‍යාංශය විසින් අධීක්ෂණය කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමථ මණ්ඩල නිලධාරීන්ගේ සේවය ඇගයීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) සමථ මණ්ඩල ක්‍රියාදාමය කාලීනව ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙල කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2586/2022

ගරු තිස්ස අත්තනායක මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දුම්රිය මගීන්ගේ පහසුකම් පුළුල් කිරීමේ අරමුණින් දුම්රිය ස්ථාන නවීකරණය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය යටතේ නවීකරණය කරනු ලබන එක් එක් දුම්රිය ස්ථානය, එම දුම්රිය ස්ථානය පිහිටි දිස්ත්‍රික්කය, එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුදල, එම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමට අපේක්ෂිත කාල වකවානුව, ව්‍යාපෘති සැලසුමට අනුව අන්තර්ගත වන වැඩ සැලැස්ම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2601/2022

ගරු අශෝක් අබේසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2022 දක්වා ශ්‍රී ලංකාව ලබාගත් විදේශීය සහ දේශීය ණය ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් ණය ලබාගෙන ඇති ආයතනය/රට වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් ණය සඳහා ගෙවනු ලබන වාරිකය සහ පොළිය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2613/2022

ගරු අනුප පස්කුවල් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2019 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ රජයේ රෝහල්වලින් ජලභීතිකා එන්නත් ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ජලභීතිකා එන්නත් නොමැතිවීම හේතුවෙන් ඉහත සඳහන් කාලය තුළදී ජලභීතිකාව වැළඳුනු රෝගීන් මරණයට පත් වී තිබේද;

(iii) එසේ නම්, එම රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත කාලය තුළදී ආනයනය කර ඇති ජලභීතිකා එන්නත් සංඛ්‍යාව කොපමණද;

(v) ඒ සඳහා වැය වූ සම්පූර්ණ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2620/2022

ගරු ඩී. වීරසිංහ මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ස. සීනෝර් පදනම ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) එය ආරම්භ කිරීමේ මූලික අරමුණ මේ වනවිට ඉටු වී තිබේද;

(iii) සී/ස. සීනෝර් පදනමට අයත් කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා ස්ථාපිත කර ඇති ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බෝට්ටු, දැල් සහ අනෙකුත් ධීවර ආම්පන්න ධීවර ජනතාවට සහන මිලට හෝ නොමිලේ ලබා දෙන්නේද;

(ii) ධීවර ජනතාවගේ වාර්ෂික ආදායම ඉහළ නැංවීමට සහ ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2628/2022

ගරු සම්පත් අතුකෝරළ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන යටතේ පිහිටුවා ඇති මාතෘ සායන සංඛ්‍යාව, එම එක් එක් පළාත් පාලන ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සායනවල භෞතික හා මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 සැප්තැම්බර් 09 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අධිවේගී මාර්ග ව්‍යාපෘති සඳහා අත්කර ගන්නා ලද ඉඩම් කළමනාකරණය කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ඉඩම් කළමනාකරණය කිරීම සඳහා සමාගමක් ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමතියක් ලබා දී තිබේද;

(iii) එසේ නම්, මේ වනවිට එම සමාගම ආරම්භ කර තිබේද;

(iv) නොඑසේ නම්, එම සමාගම ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(v) ඉහත සමාගමට ඉඩම් පවරනු ලබන්නේ කවුරුන් විසින්ද;

(vi) එම ඉඩම් පැවරීම සඳහා බලය ලැබී ඇති පනත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

27/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රන්, රිදී හා යකඩ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන කර්මාන්තකරුවන් පාරම්පරිකව ජීවත්වන ප්‍රදේශ සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රදේශ අයත් ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ග්‍රාම නිලධාරි වසම්වල ජීවත්වන ඉහත කර්මාන්තවල පාරම්පරිකව නිරතවන පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කර්මාන්තකරුවන් මුහුණ දෙන ප්‍රධාන ගැටලු පිළිබඳව අධ්‍යයනය කර තිබේද;

(ii) එසේ නම්, එම ගැටලු කවරේද;

(iii) ඔවුන්ට නව තාක්ෂණය හා පුහුණුවීම් ලබා දීමට කටයුතු කර තිබේ නම්, ඒ කෙසේද;

(iv) ඉහත කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ සොයා දීමට මැදිහත් වී තිබේ නම්, ඒ කෙසේද;

(v) ඔවුන්ට විදේශ රැකියා අවස්ථා ලබා දීමට වැඩපිළිවෙළක් තිබේද;

(vi) නොඑසේ නම්, වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම රටවල් කවරේද;

(iii) 2015 හා 2016 යන එක් එක් වර්ෂයේදී ඉහත භාණ්ඩ අපනයනයෙන් ලැබූ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

295/2022

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි ගඟ ආශ්‍රිතව ගන්නෝරුව, වරාතැන්න ප්‍රදේශයේ ''හත්කිඳ'' නමින් හෙක්ටයාර 59ක පමණ විශාලත්වයකින් යුක්ත ස්වභාවික දූපත් සමූහයක් පවතින බවත්;

(ii) එම පරිසර පද්ධතියේ පවතින සුවිශේෂී ජෛව විවිධත්වය හේතුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත්ව තිබූ එම ප්‍රදේශය, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත ප්‍රකාරව 2017.06.13 දින ''වරාත හත්කිඳ පරිසර ආරක්ෂණ ප්‍රදේශය'' යනුවෙන් නම් කර තිබෙන බවත්;

(iii) එහි අනවසර ගොඩනැගිලි ඉදිනොකරන ලෙස දන්වමින් මධ්‍යම පරිසර අධිකාරිය විසින් දැන්වීම් ප්‍රදර්ශනය කර ඇති බවත්;

(iv) ඉහත පරිසර පද්ධතිය විනාශ වන ලෙස පෞද්ගලික හෝටල් ඉදිකිරීමට කටයුතු කරමින් පවතින බවත්;

(v) මහනුවර නගර සභා සීමාවෙහි ඉදිකර ඇති අනවසර ගොඩනැගිලි, මහවැලි ගඟ දූෂ්‍ය වීමට හේතු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගන්නෝරුවේ සිට නව දොඩම්වල පාලම දක්වා ඉදිකර ඇති අනවසර ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත පරිසර පද්ධතියේ ඉදිකර ඇති අනවසර ගොඩනැගිලි ඉවත් කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

341/2022

ගරු හේෂා විතානගේ මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පොලීසියේ මේ වනවිට වර්ෂ 20ක හා වර්ෂ 10ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති පොලිස් කොස්තාපල්වරයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(ii) මේ වනවිට වර්ෂ 10ක හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති පොලිස් සැරයන්වරයන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත නිලධාරීන් අතරින් උසස්වීම් ලැබීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන්ට මේ දක්වා උසස්වීම් ලබා නොදීමට හේතු කවරේද;

(iii) උසස්වීම් ලැබීම සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා පොලීසියේ සියලු නිලධාරීන්ට උසස් වීම් ලබා දීම සඳහා සැලසුමක් තිබේද;

(iv) එසේ නම්, එය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

673/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මහවැලි කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම මහවැලි කලාප යටතේ ඇති ක්‍රීඩාංගන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ක්‍රීඩාංගන සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

966/2022

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකලපුව දිස්ත්‍රික්කයේ සමෘද්ධි සහනාධාර ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාසික ආදායම අනුව දරිද්‍රතා රේඛාවෙන් පහළ ස්ථරයේ සිටින මඩකලපුව දිස්ත්‍රික්කයේ බොහෝ දෙනෙකුට සමෘද්ධි සහනාධාර ලබා දී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1105/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන විසින් කැලි කසල බැහැර කිරීම හේතුවෙන් නිර්මාණය වී ඇති කුණු කඳු සංඛ්‍යාව කොපමණද;

(ii) එම කුණු කඳු පවතින ස්ථානවල නම් කවරේද;

(iii) ඒවා අතරින් වනාන්තර ආශ්‍රිතව පවතින කුණු කඳු සංඛ්‍යාව කොපමණද;

(iv) මේ හේතුවෙන් පරිසර පද්ධතියට දැඩි හානියක් සිදු වී ඇති බව දන්නේද;

(v) එසේ නම්, එම කුණු කඳු හේතුවෙන් පැන නැගී ඇති ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

1513/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සේවය කරනු ලබන කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව ග්‍රාම නිලධාරී වසම්වලට අනුයුක්ත කර ඇති ආකාරය කවරේද;

(iii) එම තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා පිරවීමට ගෙන ඇති පියවර කවරේද;

(v) උතුරු පළාත සඳහා ඉහත නිලධාරීන් පත් කර නොමැති බව දන්නේද;

(vi) උතුරු පළාත සඳහා එම නිලධාරීන් පත් කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත නිලධාරීන්ට නව සේවා ව්‍යවස්ථාවක් නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එය සකස් කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එය සකස් කරනු ලබන දිනය හා ආකාරය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඇතැම් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් ගණනයේදී, ඔවුන් ගොවි නියාමක සහ සමෘද්ධි නියාමක ලෙස කටයුතු කරන ලද සේවා කාලය සැලකිල්ලට ගෙන නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට එම සේවා කාලය ලබා දෙනු ලබන ආකාරය හා දිනය කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2639/2022

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කහතුඩුව සිට රත්නපුර හරහා පැල්මඩුල්ල දක්වා වන අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ප්‍රගතිය කවරේද;

(ii) ඊට අදාළ මැනුම් කටයුතු මේ වනවිට අවසන් කර තිබේද;

(iii) එම අධිවේගී මාර්ගය ඉදිකිරීම හේතුවෙන් ඉඩම් අහිමි වන පුද්ගලයන්ට වන්දි ගෙවීමට කටයුතු කරන්නේද;

(iv) එම මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනු ලබන දිනය සහ අවසන් කරනු ලබන දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2644/2022

ගරු ගාමිණී වලේබොඩ මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ ප්‍රගමනය සම්බන්ධයෙන් සැලකිය යුතු බලපෑමක් සිදු කර ඇති බව පිළිගන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වෘත්තීය සමිති සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

(iv) රටක ප්‍රගමනයට බාධාවක් නොවන ලෙස වෘත්තීය සමිති ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම වෙනුවෙන් ජාත්‍යන්තර වශයෙන් නියාමන ක්‍රමවේදයක් භාවිතා කරනු ලබන බව දන්නේද;

(v) එවැනි නියාමන ක්‍රමවේදයක් ශ්‍රී ලංකාවට හඳුන්වාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 1/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳ විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නොමැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳ අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳ ගවේෂණය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 2/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය සහල් වර්ගයන්හි පෝෂ්‍ය ගුණය පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම,— දැනට ශ්‍රී ලංකාවේ වෙළඳපොළ තුළ දක්නට ලැබෙන පැරණි දේශීය සහල් හා දැනට භාවිත කරන නව සහල් වර්ගයන්ගේ ඇති පෝෂ්‍ය ගුණය පිළිබඳව ද, විවිධ රෝගාබාධ ඇති අය භාවිත කළ යුතු සහල් වර්ග පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මෙන්ම, ගොවි ජනතාවට එම වී වර්ග වගා කිරීමට පහසුකම් සලසාදීම පිළිබඳව ද, රජය විසින් ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 3/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— ආක්‍රමණික පැළෑටි හා සතුන් හේතුවෙන් ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හානි විය හැකි ආක්‍රමණික පැළෑටි හා සතුන් හඳුනාගෙන, ඒවා නම්කිරීම මඟින් එම පැළෑටි හා සතුන් බෝ කිරීම හා ආනයනය කිරීම තහනම් කර ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට රජය මැදිහත් වී කඩිනමින් අවශ්‍ය නීති සම්පාදන කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් විසින් කරනු ලබන පර්යේෂණ නිබන්ධන අදාළ අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කරගනිමින් සකස් කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට පවතින විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලබන සිසුන් විසින් හදාරනු ලබන පාඨමාලා සම්බන්ධයෙන් සිදු කරනු ලබන පර්යේෂණ නිබන්ධන ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික වර්ධනයට අදාළව සිදු කිරීම වැදගත් වන හෙයින් ද, මෙම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරුන් හා එකී පර්යේෂණ නිබන්ධනවලට අදාළ අමාත්‍යාංශය අතර මනා සම්බන්ධීකරණයක් සිදු කිරීම සඳහා එක් එක් අමාත්‍යාංශ මට්ටමින් වගකිව යුතු නිලධාරියකු පත් කළ යුතු හෙයින් ද, අදාළ අමාත්‍යාංශයන් හි ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සිදු කිරීමේ දී දිගුකාලීන, මධ්‍යකාලීන සහ කෙටිකාලීන ඉලක්ක සපුරා ගැනීම සඳහා එකී නිබන්ධන යොදා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— ලොව පුරා ඇති බෞද්ධ සිද්ධස්ථාන රැක ගැනීමට පෙරමුණ ගැනීම,— ලොව පුරා සිටින බෞද්ධයන්ගේ වන්දනාවට පාත්‍රවන බෞද්ධ සිද්ධස්ථානවල ආරක්ෂාව තර කිරීමට හා අන්තර්ජාතික වශයෙන් බෞද්ධයන් වෙනුවෙන් හඬක් නැඟිය හැකි ශක්තිමත් සංවිධානයක් ගොඩනැගීම සඳහා ලොව පුරා සිටින බෞද්ධ නායකයන් හා සංවිධාන ඒකරාශී කිරීමට ශ්‍රී ලංකාව මූලිකත්වය ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල දිවයින පුරා ව්‍යාප්ත කිරීම,— ජීවිතයේ සැඳෑ සමය ගත කරමින් සිටින වැඩිහිටියන්ට තම පවුලේ සාමාජිකයන්ගෙන් මෙන්ම ඇතැම් ආයතනවලින් නොසලකා හැරීම් නිසා සිදුවන විවිධ අසාධාරණ සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ, වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩපිළිවෙළ පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය ඔස්සේ අළෙවි කිරීම මඟින් සිදු කරන ඖෂධ ජාවාරම මැඩපැවැත්වීම,— වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවණ්‍ය නිෂ්පාදන විශාල ලෙස අළෙවි කරන බැවින් ද, මෙය අප රටේ ජනතාවගේ ජීවිතාරක්ෂාවට විශාල තර්ජනයක් වන බැවින් ද, මෙම තත්ත්වය මැඩපවත්වා ගැනීම සඳහා නිසි වැඩපිළිවෙළක් රජය විසින් සකසා ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— ණය ක්‍රමයක් මඟින් වැඩිහිටි ප්‍රජාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවෙහි ජීවනෝපාය මාර්ග ශක්තිමත් කර දීමෙන් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ඔවුන්ව දායක කර ගත හැකි වන හෙයින් ද, මෙම වැඩිහිටි ප්‍රජාව සඳහා බැංකු පද්ධතිය

මඟින් ණය පහසුකම් ලබා නොදීම හේතුවෙන් ඔවුන්ට සමාජය තුළ වෙනස්ව සැලකීමක් සිදුවන හෙයින් ද, බැංකු පද්ධතිය මඟින් වයස අවුරුදු 60 ඉක්මවන්නන් හට ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— විශ්‍රාමික ග්‍රාම නිලධාරීන් හට සාම විනිසුරු පදවි ලබාදීම,— ග්‍රාමීය වශයෙන් ජනතාවට ඉතා සමීප සේවාවක් ඉටු කරන සුවිශේෂී රාජ්‍ය නිලධාරියකු වන ග්‍රාම නිලධාරිවරයන් විශ්‍රාම යාමෙන් අනතුරුව ඔවුන්ගේ සේවය තවදුරටත් ගෞරවනීය සේවාවක් ලෙස ලබා ගැනීම සඳහා දැනට විශ්‍රාමික සහ ඉදිරියේ දී විශ්‍රාම ගන්වනු ලබන ග්‍රාම නිලධාරීන්ගේ සුදුසුකම් අනුව සාම විනිසුරු පදවිය ලබා දීමට සුදුසු පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සවිබල ගැන්වීම,— ශ්‍රී ලංකාවේ සහල් මිල පාලනය කිරීමට හැකියාව ඇති සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වර්තමානය වනවිට දුෂ්කරතා රැසකට මුහුණ දී සිටින බැවින්, එම ගැටලු විසඳීමට කඩිනමින් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— දරුවන්ට එරෙහිව සිදුවන ශාරීරික දඬුවම් ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීම,— දරුවන්ට එරෙහිව සිදුවන ශාරීරික දඬුවම් හා මානසික හිංසන හෙළාදකිමින් 2021.02.12 දින ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC/ FR/97/2017 මඟින් දණ්ඩ නීති සංග්‍රහයේ අංක 341(i) වගන්තිය අහෝසි කිරීම, UNCRC හි වගන්ති අංක 19, 28(2) සහ 37 ක්‍රියාත්මක කිරීම සහ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 12/2016 ක්‍රියාත්මක කිරීම සඳහා තීන්දුවක් ලබා දී ඇති හෙයින් ද, 2020.03.01 දින අවුරුදු 08 ක දැරියක් නිවසේදී වේවැලකින් පහර දී මරණයට පත්කිරීමේ සිදුවීම පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර මාධ්‍ය අවධානයට ලක් වුවද ඉහත ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මත හෝ ඒ සම්බන්ධයෙන් සැලකිය යුතු පියවර ගනු නොලැබූ හෙයින් ද, දරුවන්ට ඇතිවිය හැකි දීර්ඝකාලීන අහිතකර ප්‍රතිවිපාක ඉස්මතු කරමින් 2018.02.02 එක්සත් ජාතීන්ගේ ළමා අයිතීන් පිළිබඳ කමිටුවේ (UNCRC) ශ්‍රී ලංකාව පිළිබඳ අධීක්ෂණ වාර්තාව මඟින් ළමා ආරක්ෂණයේ අර්බුදකාරී තත්ත්වය, විශේෂයෙන්ම ශාරීරික දඬුවම් අවසන් කිරීම අවධාරණයට ලක් කර ඇති හෙයින් ද, 2020.10.06 දිනැති පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තා අංක 304/2020 හි සඳහන් වන පරිදි අධ්‍යාපන අමාත්‍යවරයා විසින් විශාල වශයෙන් ඉහළ යන ළමා අපයෝජන සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ සේවාව පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බව ප්‍රකාශ කර ඇති හෙයින් ද, කඩිනමින් නීති වෙනස් කිරීමෙන් සහ පවතින නීති විධිමත්ව ක්‍රියාත්මක කිරීමෙන් ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික අර්බුදය අවසන් කිරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවය ස්ථාපනය කිරීම,— රජය නියෝජනය කරමින් හා ග්‍රාමීය ජනතාවට සමීපව කටයුතු කරමින් සුවිශාල මෙහෙවරක් ඉටු කරන ග්‍රාම නිලධාරින් සඳහා වූ ව්‍යවස්ථාවක් නිර්මාණය කර "ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවය" ලෙස ස්ථාපනය කිරීමට නිසි පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— සහනාධාර ලැබිය යුතු පුද්ගලයන්ට සමෘද්ධි සහනාධාර ලබාදීම,— සමෘද්ධිලාභින් මෙන්ම සමෘද්ධි සහනාධාර නොලබන අඩු ආදායම්ලාභි ජනතාව සම්බන්ධයෙන් විධිමත් සමීක්ෂණයක් සිදුකර සත්‍ය වශයෙන්ම සමෘද්ධි සහනාධාර ලැබිය යුතු පිරිස තෝරා ගෙන ඔවුන්ට එය ලබා දීමට සුදුසු පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම,— අධ්‍යාපන විද්‍යාපීඨවල විධිමත් ගුරු පුහුණුව අවසන් කරන්නන්ට ප්‍රමුඛත්වය ලබා දෙමින් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— සමෘද්ධි සහනාධාරය වෙනුවට කිරි ගවයකු ලබාදීම,— ග්‍රාමීය වශයෙන් තෝරාගනු ලබන අඩු ආදායම්ලාභී පවුල්වලට සමෘධි සහනාධාරය වෙනුවට කිරි ගවයකු බැගින් ලබා දී ඔවුන්ගේ ආර්ථිකය නගා සිටුවීමට රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අපනයනය තුළින් රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— දේශීය ආහාර නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කෘෂිකාර්මික රටක් ලෙස ගොවි ජනතාවට අවශ්‍ය සියලුම යටිතල පහසුකම් හා සේවා රජයේ මැදිහත්වීමෙන් ලබා දී ආනයනය වෙනුවට අපනයනය තුළින් ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් සඳහා නිශ්චිත ජාතික ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් සකස් කිරීම,— ශ්‍රී ලංකා ගුරු සේවය, ශ්‍රී ලංකා විදුහල්පති සේවය ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයේ තනතුරු සඳහා නිශ්චිත ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් මේ වනවිට සකස් කර අධ්‍යාපන අමාත්‍යාංශය සතුව තිබුණ ද, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සඳහා මෙතෙක් ස්ථාන මාරුවීම් ජාතික

ප්‍රතිපත්තියක් සකස් කොට නොමැති හෙයින් එම නිලධාරින් අසහනයට පත්ව ඇති හෙයින් ද, එම තත්ත්වය වැළැක්වීමට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් සඳහා ද ජාතික ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් සකස් කිරීම මෙන්ම ගුරු/ විදුහල්පති ස්ථාන මාරුවීමේ ජාතික ප්‍රතිපත්තිය ද සක්‍රීය කිරීම සඳහා රජය විසින් කඩිනම් පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/2022

ගරු රෝහණ බංඩාර මහතා,— ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය කාලීන අවශ්‍යතා අනුව වෙනස් කිරීම,— සංවර්ධිත රටවල පවා ගොවි ජනතාව වෙනුවෙන් විවිධ සුබසාධන වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක වන හෙයින් ද, ශ්‍රී ලංකාවේ ගොවි ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වන ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය කාලීන අවශ්‍යතා අනුව වෙනස් නොවීම හේතුවෙන් ඒ සඳහා ගොවීන් ආකර්ෂණය කර ගැනීමේ දුෂ්කරතා මතු වී ඇති හෙයින් ද, ගොවි ජනතාවට වැඩි ප්‍රතිලාභ ලැබෙන ආකාරයට මෙම ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය රජය විසින් නැවත සමාලෝචනය කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/2022

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපනය සඳහාම වෙන් වූ රූපවාහිනී නාලිකාවක් ආරම්භ කිරීම,— පවත්නා කොවිඩ්-19 වසංගතය හමුවේ වර්තමානය වනවිට පාසල් වසා දමා තිබීම හේතුවෙන් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට ප්‍රයෝජනවත් වන අධ්‍යාපනය සඳහාම වෙන් වූ රූපවාහිනී නාලිකාවක් රජය විසින් කඩිනමින් ආරම්භ කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/2022

ගරු රෝහණ බංඩාර මහතා,— පළාත් පාලන ආයතනවල රැකියා ලබා දීමේ දී සාධාරණ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම,— මහජනතාව වෙනුවෙන් උපතේ සිට මරණය දක්වාම වැදගත් කාර්ය භාරයක් ඉටු කරන පළාත් පාලන ආයතනවල සුළු සේවක, කම්කරු ආදී පත්වීම් ලබාදීමේ දී බොහෝ විට එම පළාත් පාලන ආයතනයේ ප්‍රධානියාගේ කොට්ඨාසයට සුවිශේෂීතාවයක් ලබාදෙන අවස්ථා වර්තමානයේ දක්නට ලැබෙන හෙයින් එම තත්ත්වය වෙනස්කොට අදාළ පළාත් පාලන ආයතනයේ සෑම කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි එම රැකියා ලබාදීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

**2022 සැප්තැම්බර් 20 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1525/2022

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉපලෝගම පොලිස් ස්ථානය පවත්වාගෙන යාම සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් නොමැතිවීම හේතුවෙන් මේ වනවිට එම පොලිස් ස්ථානය පවත්වාගෙන යාම සඳහා "රණජයපුර" නිවාස සංකීර්ණයට අයත් නිවාස භාවිතා කරනු ලබන බවත්;

(ii) මෙම පොලිස් ස්ථානයට අදාළ බලප්‍රදේශය සඳහා ග්‍රාම නිලධාරි වසම් 33ක් අයත්වන බවත්;

(iii) එම පොලිස් ස්ථානයට ලබාදී ඇති නිල රථය භාවිතා කිරීමට නුසුදුසු තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පොලිස් ස්ථානය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(ii) පොලිස් ස්ථානයේ භාවිතය සඳහා නව නිල රථයක් ලබා දීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1671/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ වතුකරයේ ජීවත් වන පවුල් සඳහා නිවාස පහසුකම් ලබා දීමට —

(i) මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග;

(ii) ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1894/2022

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2030 වනවිට ශ්‍රී ලංකාවේ සමස්ත විදුලිබල අවශ්‍යතාවයෙන් 30%ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් උත්පාදනය කරනු ලබන බව "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් වන බව දන්නේද;

(ii) මේ වනවිට ක්‍රියාත්මක කරනු ලබන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එම ව්‍යාපෘතිවල විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ඉතා මන්දගාමීව ක්‍රියාත්මක කරනු ලබන බව දන්නේද;

(ii) එම ව්‍යාපෘති කඩිනම් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1999/2022

ගරු ජේ.සී. අලවතුවල මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එවකට ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද "නිල සෙවණ" ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ වර්ෂ 2016 සිට 2019 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ "නිල සෙවණ" ඉදිකරන ලද එක් එක් ග්‍රාම නිලධාරි වසම සහ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය කවරේද;

(ii) එම එක් එක් "නිල සෙවණ" ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2020 සහ 2021 වර්ෂවල ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම "නිල සෙවණ" ඉදිකරනු ලැබූ එක් එක් ග්‍රාම නිලධාරි වසම සහ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස කවරේද;

(iii) එම එක් එක් "නිල සෙවණ" ඉදිකිරීම සඳහා වැය කරනු ලැබූ මුදල කොපමණද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2041/2022

ගරු වේලු කුමාර් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ සහ ගඟ ඉහළ කෝරළේ යන එක් එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති වතු අතරින් නියමිත ප්‍රමිතියට අනුව නල මාර්ගයෙන් පානීය ජලය සපයනු ලබන වතු සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වතුවල නම්, ඉහත සඳහන් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;-

(iii) නල මාර්ගයෙන් පානීය ජලය සපයනු ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව ඉහත සඳහන් එක් එක් වතුයාය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටා ඇති වතුවල පවතින උග්‍ර පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2059/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හොරණ, වගවත්ත ටයර් කර්මාන්තශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතියට යටිතල පහසුකම් ලබා දීම සඳහා භාවිතා කරන ලද අරමුදල් කවරේද;

(ii) එම කර්මාන්තශාලාව සඳහා ලබා දී ඇති විදුලි සම්බන්ධතාවය මෙගාවොට් කොපමණද;

(iii) ඉහත ව්‍යාපෘතිය සඳහා ජල සැපයුම ලබා දෙන ලද ආකාරය කවරේද;

(iv) එම ව්‍යාපෘතියේ පිවිසුම් මාර්ගය ඉදිකිරීම සඳහා රජය විසින් වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2169/2022

ගරු රෝහණ බංඩාර මහතා,—බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර-ඇතුළු නුවර පදිංචි වී සිටින පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට මේ දක්වා නීත්‍යානුකූල පදිංචිය ලබා දී නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන්ට නීත්‍යානුකූල පදිංචිය ලබා දීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2517/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා තෝරා ගන්නා ලද විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ඒ සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඉහත සඳහන් ආචාර්යවරුන් අතරින් සිය පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම අතරමඟ නවතා දමා ඇති ආචාර්යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ඒ හේතුවෙන් අපතේ ගොස් ඇති මුදල කොපමණද;

(iv) මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2532/2022

ගරු තවරාජා කලෙයි අරසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර අධ්‍යාපන කලාපයේ වෙස්ලි උසස් පාසලේ තාක්ෂණික පීඨය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහනේ අධ්‍යක්ෂවරයාගේ 2020.06.25 දිනැති ලිපිය මඟින් ලබාදුන් අවසරය මත ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලද බවත්;

(ii) ඒ සඳහා ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් එම පාසලේ පරිගණක ඒකකය සහ පංති කාමර 5ක් ස්ථාපනය කර තිබූ වසර 60ක් පමණ පැරණි ගොඩනැගිල්ල නැගෙනහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂවරයාගේ අවසරය සහ කලාප අධ්‍යාපන කාර්යාලයේ තාක්ෂණික නිලධාරින්ගේ උපදෙස් මත ඉවත් කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම තාක්ෂණික පීඨයේ ඉදිකිරීම් කටයුතු මේ වනවිට නවතා දැමීමට හේතු කවරේද;

(ii) එහි ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2535/2022

ගරු මධුර විතානගේ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?